**සොරණාතොට ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සොරණාතොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.168,211 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.5,637,184 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් බදු | 11,387,351 | 96,169 | 55,329 | 40,840 | 4,947,724 | 97,905 | 56,314 | 41,591 |
| **(ii)** | කුලී | 1,205,200 | 713,677 | 503,886 | 209,791 | 1,087,200 | 725,520 | 507,987 | 217,533 |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 1,043,000 | 0 | 0 | 0 | 1,074,400 | 0 | 0 | 0 |
| **(iv)** | වෙනත් ආදායම් | 11,988,682 | 2,433,135 | 1,913,325 | 519,810 | 11,134,000 | 2,273,740 | 1,725,835 | 547,905 |
| | එකතුව | **25,624,233** | **3,242,981** | **2,472,540** | **770,441** | **18,243,324** | **3,097,165** | **2,290,136** | **807,029** |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් හා අක්කර බදු රු.159,417 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි වරිපනම් හා අක්කර බදු අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි කඩ කුලී සහ හිඟ කඩ කුලී දඩ රු.204,243 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | අයිතිකරුවන් හඳුනා ගැනීමට නොහැකිවීම හා ස්වභාවික විපත් හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණු ආදායම් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, අනෙකුත් හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | කුලී නියමිත කාලය තුළදී අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි ජල ගාස්තු රු. 234,305 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායමෙන් රු.112,987 ක් කපා හැරීමට කඩහිමියන් ඉල්ලීම් කොට ඇත.අනෙකුත් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි ජල ගාස්තු අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.2,284,627 ක් ගෙන්වාගෙන නොතිබුණි. | 2024.03.31 දිනට උසාවි දඩ, මුද්දර ගාස්තු රු.899,697 ක් ලැබී ඇති බව. | තවදුරටත් පවතින හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුන්හිඳ දියඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගෙන් අය කරන ගාස්තු සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වුවත්, පොදු පහසුකම් සහිත ස්ථානයකට ප්‍රමාණවත් ජල පහසුකම් නොතිබීම නිසා දියඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් කෙරෙහි අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය විය. | රේඛීය අමාත්‍යාංශයෙන් හා (සංචාරක) පළාත් සභාවෙන් ප්‍රතිපාදන ලබාදීමට සංවර්ධන යෝජනා කැඳවා ඇති අතර, අදාළ ප්‍රතිපාදන මත ඉදිරියේදී අදාළ පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කරන බව. | සංචාරකයින්ගේ අවශ්‍යතා පහසුවෙන් ඉටුකරගත හැකි වන ලෙස පොදු පහසුකම් ඇති කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් දියඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළ යුතු වුවද, ප්‍රවේශ මාර්ගයේ සිට දියඇල්ල දක්වා වූ මාර්ගයේ පවතින අනාරක්ෂිත ස්ථානවල වැට ඉදිකිරීම, මාර්ගයට නැඹුරුව පවතින දිරාපත් වූ ගස් ඉවත් කිරීමට සහ මාර්ගය දෙපස බහුලව රැඳී සිටින රිළවුන්ගෙන් සංචාරකයින්ට සිදුවන හිරිහැර සම්බන්ධයෙන් වන ගැටළු වැලැක්වීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | -එම- | සංචාරකයින්ගේ ආරක්ෂාව සඳහා සුදුසු ආරක්ෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට පැවත එන ණයහිමි ශේෂ රු.7,431,386 ක් නිරවුල් කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ගෙවීමට හැකියාව ඇති වවුචර් සඳහා ගෙවීම් සිදු කිරීමටත් අනෙකුත් ශේෂයන් පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිත කරනු ලබන ට්‍රැක්ටර් රථයක, ටේලරයක, ජල බවුසරයක, සහ ලොරි ජල බවුසරයක අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය සභාවට පවරාගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ජල බවුසරයක් 2019 වර්ෂයේ සිට භාවිතයට නොගෙන අනාරක්ෂිතව සභා භූමියේ ගාල් කර තිබුණි. | භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයේ පවතින වත්කම් ඉදිරියේදී අපහරණය කිරීම සඳහා කමිටු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | වත්කම් නිසි නඩත්තුවක් කර භාවිතයට ගත යුතුය. |